# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி , சமூக பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DSD/HO/14/SS/11/04/2024 | ඔබේ අංකය<br>உமது இல<br>Your No ..................... | දිනය<br>திகதி<br>Date 2024.12.11 |

සමෘද්ධි චක්‍රලේඛ 2024/13

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් ගණකාධිකාරීවරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් /දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන්,
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්,
සියළුම සමෘද්ධි මුලස්ථාන කළමණාකරුවන්,
සියළුම විෂයභාර නිලධාරීන්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

## <u>සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල</u>
## <u>2024.12.31 දිනට ගෙවීම් කටයුතු අවසන් කිරීම</u>

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් සියළුම දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල හා ප්‍රාදේශීය සමෘද්ධි කාර්යාලවල සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ කාර්යන්හි නියුක්ත නිලධාරීන් පහත උපදෙස් අනුගමනය කරමින් අරමුදලට අදාල ගිණුම් පියවීමට සිදු කළ යුතු බව කාරුණිකව දන්වමි.

02. සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ පහත සඳහන් අවස්ථා යටතේ ගිණුම් පියවීමට අදාලව කටයුතු කළ යුතුය.

i. 2024.03.04 දිනැතිව හා අංක DSD/HO/14/SS/2/viii/3/2023 දරන චක්‍රලේඛය හා සමාංක 2024.07.05 දිනැති ලිපිය අනුව 2022/2024 හා 2023/2025 අධ්‍යයන වර්ෂයන්ට අදාලව සිදු කරනු ලබන වියදම.

ii. නව සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන (One Village One Product) වැඩසටහන හා විසිරුණු (තනි පුද්ගල) ව්‍යාපෘති වැඩසටහන සඳහා 2024 වර්ෂයේ දිස්ත්‍රික්ක වෙත නිදහස් කරන ලද මුදල් .

03. ඉහත අවස්ථා i හා ii යටතේ ලබාදුන් චක්‍රලේඛ උපදෙස් පරිදි 2024.12.31 දිනට පෙර සියළු ගෙවීම් සිදු කළ යුතු අතර. 2022/2024 අධ්‍යයන වර්ෂයට අදාලව 2024 වර්ෂය වෙනුවෙන් දැරිය යුතු කිසිදු වියදමක් වෙනුවෙන් 2025 ජනවාරි මස තුල ගෙවීම් සිදු නොකරන බව ද දැනුම් දෙමි.

04. 2024 වර්ෂය තුල ඉහත සඳහන් කරන ලද අවස්ථා යටතේ අරමුදලින් මුදල් නිදහස් කිරීමේදී අත්තිකාරම් ලබාදීමක් සිදු නොවූ අතර සත්‍ය ගෙවීම් සඳහා පමණක් මුදල් නිදහස් කිරීමක් සිදු විය.එහෙත් ඉහත අංක i හා iii යටතේ ඒ ඒ දිස්ත්‍රික්ක තුල ගෙවීම් කර ඉතිරි යම් මුදලක් වේ නම් 2024.12.26 දිනට පෙර ගිණුම් අංක **2323330 දරන ලංකා බැංකුව බත්තරමුල්ල ගිණුම** වෙත බැර කරන මෙන් ද දන්වමි.


**1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பக்காரமுல்ல / 1st Step. 4 th floor, Sethsiripaya Battaramulla**

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk<br>**Hot Line :0112-889007** | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

**05.** **මුදල් පොත පියවීම, ඉතිරි මුදල් ආපසු භාරදීම හා වියදම් වර්ගීකරණ වාර්තා ඉදිරිපත් කිරීම**

**(අ). ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ගෙවීම් කටයුතු අවසන් කර ගිණුම් පියවීම.**

සියළුම ප්‍රාදේශීය සමෘද්ධි කාර්යාල විසින් 2024.12.27 වන විට සමෘද්ධි සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහනට හා ආදර්ශ ගම්මාන වැඩසටහනට අදාල ඉහත සඳහන් කරන ලද සියළු ගෙවීම් කටයුතු නිම කර ඒ වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන නිල ගිණුම හා සම්බන්ධ මුදල් පොත තුලනය කර ශේෂය සම්පූර්ණයෙන් දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන නිල ගිණුම් වෙත ප්‍රේෂණය කළ යුතුය.

ප්‍රාදේශීය සමෘද්ධි කාර්යාල 2024.12.27 දිනට මුදල් පොතේ ශේෂය ගණනය කිරීමේදී ඉහත සඳහන් සියළු ගෙවීම් සිදු කර ඇති බවට ද අනාවරණය කර ගත් ගිණුම් දෝෂයක් වේ නම් ඒවා නිරවුල් කිරීම් සහ බැංකු සැසඳුම් මගින් අනාවරණය වි ඇති මුදල් පොතේ ශේෂයට බලපාන ගණුදෙනු වේ නම් ඒවා සියල්ල නිවැරදිව ගැලපුම් කළ යුතුය.2024.12.31 දිනට ප්‍රාදේශීය සමෘද්ධි කාර්යාලයේ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ නිල ගිණුමේ මුදල් පොත ශූන්‍ය විය යුතු අතර, කිසිදු ආකාරයකින් එම ගිණුමෙහි මුදල් රඳවා ගැනීමක් සිදු වි නොමැති බවට ප්‍රාදේශීය සමෘද්ධි කාර්යාලයේ වග කිව යුතු නිලධාරීන් මෙන්ම දිස්ත්‍රික් කාර්යාලයේ ගණකාධිකාරී හා සමෘද්ධි අධ්‍යක්ෂ විසින් ද වග බලා ගත යුතු බවට අවධාරණය කරමි.

**(ආ). දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලට අදාල ගෙවීම් කටයුතු අවසන් කර ගිණුම් පියවීම.**

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල විසින් 2024.12.30 දින පස්වරු 3.00 පෙර සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ 2024 ගිණුම් වර්ෂය සඳහා වූ සියළු ගෙවීම් කටයුතු නිම කර ඒ වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන නිල ගිණුමට අදාල මුදල් පොත තුලනය කර ශේෂය ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ "සමෘද්ධි භාරකාර අරමුදල අංක 02 ගිණුමට ප්‍රේෂණය කළ යුතුය"

දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය විසින් මුදල් පොතේ ශේෂය ගණනය කිරීමේදී නිකුත් කර ඇති සියළු අත්තිකාරම් නිරවුල් වී ඇති බවත්, අනාවරණය කර ගත් ගිණුම් දෝෂයක් වේ නම් ඒවා නිවැරදි කිරීම් හා බැංකු සැසඳුම් මගින් අනාවරණය වී ඇති මුදල් පොතේ ශේෂයට බලපාන කරුණු වේ නම්, ඒවා සියල්ල ගැලපුම් කර ඇති බවටත් සෑහීමකට පත්විය යුතුය. තවද ශේෂය ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කිරීමේදී අදාල චෙක්පත 2024.12.31 දිනට හෝ එදිනට පෙර මුදල් පොතට ඇතුලත් කිරීමට හැකිවන සේ ගෙනවිත් භාරදීම හෝ ප්‍රධාන කාර්යාලීය ගිණුමට ඍජුව තැන්පත් කර බැංකු තැන්පතු කුවිතාන්සියේ පිටපතක් හා චෙක්පතෙහි පිටපතක් ද ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල වෙත එවීමට කටයුතු කළ යුතු වේ.

නියමිත දිනට ගිණුම් පියවීමෙන් පසු දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය විසින් සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලට අදාල පහත සඳහන් වාර්තා හා ලේඛන 2024.12.31 දිනට හෝ එදිනට පෙර ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

i. ආවරණ ලිපිය.
ii. 2024.12.31 දිනට වියදම් වර්ගීකරණ වාර්තාව ( ඇමුණුම් 01)
iii. සිප්දොර ශිෂ්‍යත්ව ගෙවීම් අදියර අනුව (ඇමුණුම් 02)
iv. නව සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන (One Village One Product) වැඩසටහන හා විසිරුණු (තනි පුද්ගල) ව්‍යාපෘති වැඩසටහන අදාල ප්‍රගතිය (ඇමුණුම අංක 03)

06. මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කර නියමිත දිනයන්ට ගිණුම් පියවීමේ කටයුතු අවසන් කිරීම සඳහා අදාල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටින අතර, වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා පහත සඳහන් කර ඇති නිලධාරීන් ඉදිරියෙන් දක්වා ඇති දුරකථන අංක ඔස්සේ ඇමතීම මගින් ලබා ගත හැකි බව දන්වමි.

සමාජ ආරක්ෂණ කළමණාකරු - ඩබ්. රුක්මා මානෙල් මිය 0112-864398/ 071-8189370
සමාජ ආරක්ෂණ කළමණාකරු - චම්පා ඕපාත මිය 0112-864398/ 076-1497996

මේ සඳහා ඔබ ඇතුළු සියළු නිලධාරීන්ගෙන් ලැබෙන සහාය ඉතා අගය කොට සලකමි.

සී.ඩී. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:- 1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.